(අටවැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක 104.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2016 ඔක්තෝබර් මස 04 වැනි අඟහරුවාදා අ. භා. 1.00 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

389/'15

1.

ගරු බුද්ධික පතිරණ මහතා,— ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ඉඟුරු වගාවට දිලීර රෝගයක් වැළඳී ඇති බවත්;

(ii) එහෙයින් කළුතර දිස්ත්‍රික්කය ඇතුළු දිස්ත්‍රික්ක ගණනාවක ඉඟුරු වගාවට හානි වී ඇති බවත්;

(iii) මේ වනවිට ඉඟුරු මිල ඉතා පහළ අගයක පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) උක්ත දිලීර හානිය වළක්වා ගැනීමට කෘෂිකර්ම දෙපාර්තමේන්තුව පියවරගෙන තිබේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) 2015 වර්ෂය තුළදී ශ්‍රී ලංකාවට ආනයනය කළ ඉඟුරු ප්‍රමාණය කිලෝග්‍රෑම් කොපමණද;

(ii) රටට අවශ්‍ය ඉඟුරු ප්‍රමාණය රට තුළම නිෂ්පාදනයට අවශ්‍ය පියවර ගෙන තිබේද;

(iii) එසේ නම්, එම පියවර කවරේද;

(iv) ඉඟුරු ආනයනය සීමා කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) ඉඟුරු මිල ඉහළ නැංවීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ කෙසේද;

(iii) ඉඟුරු වගාව දියුණු කිරීමට ගන්නා වෙනත් ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

572/'16

2.

ගරු සෙය්යිඩ් අලී සාහීර් මවුලානා මහතා,— රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සම්මන්තුරේ, අම්පාර පාර, පෝඩියාර් වීදිය, අංක 438 දරන ස්ථානයේ පදිංචි, කේ. එල්. ෆස්ලි නිසාර් මහතාගේ ආබාධිත විශ්‍රාම වැටුප් (වි. වැ. අංක 01-857916) අයදුම්පත්‍රය හා එයට අදාළ සෞඛ්‍ය 307 වාර්තාව (ආබාධිත තත්ත්වයට පත්වූ නිවැරදි දිනය වන 2006.04.18 දිනය සඳහන් කර), අංක DSS/FMG/PEN/DI/2013-2 හා 2013.12.19 දිනැති ලිපිය මඟින් සම්මන්තුරේ ප්‍රාදේශීය ලේකම් විසින් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් දැනුවත් කරන ලද බව දන්නේද;

(ii) එසේ නම්, ඔහුගේ විශ්‍රාම වැටුප කඩිනමින් ලබාදීමට පියවර ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

595/'16

3.

ගරු ලකී ජයවර්ධන මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචි කර ඇති දේශීය හා විදේශීය පෞද්ගලික මූල්‍ය සමාගම් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සමාගම් සහ ඒවා පිහිටා ඇති ස්ථාන කවරේද;

(iii) සමහර මූල්‍ය සමාගම්, ගනුදෙනුකරුවන් අපහසුතාවයට පත්වන අයුරින් කටයුතු කරන බව පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම සමාගම්වල ක්‍රියා කලාපයන් නිසා අපහසුතාවයට පත්වූ ගනුදෙනුකරුවන්, එම සමාගම්වලට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇති බව දන්නේද;

(ii) එසේ නම්, ගනුදෙනුකරුවන්හට සිදුවන අපහසුතා අවම කිරීම සඳහා මූල්‍ය ආයතන නියාමනය කිරීමට විධිමත් ක්‍රමවේදයක් සකස් කරන්නේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

610/'16

4.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පිළිකා රෝගීන් සඳහා ලබාදෙන NIMOTUZUMAB නමැති ඖෂධය ශ්‍රී ලංකාවට ආනයනය කර ඇති වාර සංඛ්‍යාව කොපමණද;

(ii) එම ඖෂධය ආනයනය කරන ලද දිනයන් කවරේද;

(iii) එක් එක් වාරයේදී ආනයනය කරන ලද ඖෂධ ප්‍රමාණ, ඒ සඳහා වැය වූ මුදල සහ ආනයනය කළ සමාගම වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම ඖෂධය ගෙන්වීම සඳහා ජාතික අන්තරායකර ඖෂධ පාලක මණ්ඩලයේ හෝ වෙනත් ආයතනයක, අදාළ සමාගම් ලියාපදිංචි වී තිබේද;

(ii) එසේ නම්, එම දින කවරේද;

(iii) එම ඖෂධය තවමත් පර්යේෂණ අවස්ථාවේ පවතින බව පිළිගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

622/'16

5.

ගරු චමින්ද විජේසිරි මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ඌව පළාත් ප්‍රධාන අමාත්‍යවරයා විසින් පළාත් සභා ගිණුමක් සිය පෞද්ගලික පරිහරණයට පවරාගෙන ඇති බව දන්නේද;

(ii) පවතින මූල්‍ය රෙගුලාසිවලට සහ පළාත් සභා රීතීන්ට එය කෙතෙක් දුරට එකඟද;

(iii) යම් නීතිවිරෝධී හෝ අයථා ගණුදෙනුවක් සිදු වී තිබේනම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

628/'16

6.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා,— රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2001 – 2004 කාලය තුළ පැවති එක්සත් ජාතික පක්ෂ රජය විසින් විකිණීමේ හෝ දීර්ඝකාලීන බදු පදනම මත පෞද්ගලික සමාගම් හෝ පුද්ගලයන් වෙත ලබාදී ඇති රාජ්‍ය වැවිලි සංස්ථාවට අයත් වතු සංඛ්‍යාව කොපමණද;

(ii) එම වතුවල නම්, ඒවායේ අක්කර ප්‍රමාණය, විකිණූ හෝ බදු දුන් මුදල, විකිණූ හෝ බදු පදනම මත ලබාදුන් සමාගම් හෝ පුද්ගලයන්ගේ නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම වතු ලබා දී ඇත්තේ කැබිනට් අනුමතිය, විවෘත ටෙන්ඩර් පටිපාටියකට අනුව හෝ රජයේ තක්සේරුවකට යටත්වද;

(iv) එවැනි කොන්දේසි කිසිවක් නොමැතිව මෙම ඉඩම් විකුණා හෝ බදු දී ඇත්නම්, එම ඉඩම් නැවත රජයට පවරා ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

635/'16

7.

ගරු වාසුදේව නානායක්කාර මහතා,— රාජ්‍ය පරිපාලන සහ කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විශ්‍රාම වැටුප් විෂමතාවය ඉවත් කරන බවට පසුගිය මැතිවරණ සමයේ දුන් පොරොන්දුව අනුව එම විෂමතාවය ඉවත් කර තිබේද;

(ii) විශ්‍රාම වැටුප් විෂමතා සකස් කර ගෙවීම් කරන තෙක් එකවර මාස 2ක් සඳහා ගෙවන ලද දීමනාව ආපසු අය කර ගෙන තිබේද;

(iii) විශ්‍රාම වැටුප් ගෙවීමේදී එම වැටුපෙන් වැන්දඹුවන්ට ගෙවූ මුදල කපා හැර තිබේද;

(iv) කලින් විශ්‍රාම වැටුප් ගෙවීමේදී වයස 21ට අඩු අවිවාහක ගැහැණු දරුවන්ට හා වයස 18ට අඩු දරුවන්ට තිබූ විශ්‍රාම වැටුපෙන් හිමිකම් මේ වනවිට අහිමිකර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

642/'16

8.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත හෝ පනතේ සංකල්පීය පත්‍රිකාවක් කෙටුම්පත් කිරීම සඳහා කිසියම් පුද්ගලයන් පිරිසකට ගෙවීමක් කර තිබේද;

(ii) ගෙවීම් ලද පුද්ගලයන්ගේ නම්, ගෙවීමට හේතු සහ එක් එක් පුද්ගලයාට ගෙවන ලද මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

650/'16

9.

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015.10.01 සිට 2016.03.30 දක්වා කාලය තුළ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට බඳවාගෙන ඇති සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම් කවරේද;

(iii) ඔවුන් බඳවා ගත් ක්‍රියාපටිපාටිය කවරේද;

(iv) ඔවුන් බඳවා ගැනීම සඳහා අනුමත කාර්ය මණ්ඩල පුරප්පාඩු තිබුණේද;

(v) එසේ නම්, පැවති අනුමත කාර්ය මණ්ඩල පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(vi) එක් එක් පුද්ගලයා තෝරා ගත් නිර්ණායකයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

658/'16

10.

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මුස්ලිම් විවාහ හා දික්කසාද පනත යටතේ පත්කරනු ලබන ක්වාසි විනිසුරුවන් සඳහා ලබාදෙන රු.6000/-ක මාසික දීමනාව සහ ලිපිකරු දීමනා ඇතුළු කාර්යාල පහසුකම් සඳහා ලබාදෙන රු.5000/-ක දීමනාව කිසිසේත් ප්‍රමාණවත් නොවන බව පිළිගන්නේද;

(ii) වර්තමාන ජීවන තත්ත්වය හා වියදම් සැලකිල්ලට ගෙන එම දීමනා වැඩිකිරීම සඳහා අවශ්‍ය පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

664/'16

11.

ගරු බිමල් රත්නායක මහතා,— වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කන්කසන්තුරේ වරාය නවීකරණය කිරීම සඳහා ශ්‍රී ලංකා රජය, ඉන්දීය රජය හෝ ඉන්දියානු සමාගමක් සමඟ ගිවිසුමක් හෝ එකඟතාවයක් ඇති කරගෙන තිබේද;

(ii) එසේ නම්, එම ගිවිසුම හෝ එකඟතාවය මෙම සභාවට ඉදිරිපත් කරන්නේද;

(iii) එම ගිවිසුම හෝ එකඟතාවය සඳහා කැබිනට් මණ්ඩලයේ හා නීතිපති දෙපාර්තමේන්තුවේ අනුමතිය සහ නිරීක්ෂණ සහිත ලියවිලි ඉදිරිපත් කරන්නේද;

(iv) මෙම කොන්ත්‍රාත්තුව අදාළ සමාගමට ලබා දී ඇත්තේ, විවෘත ටෙන්ඩර් පටිපාටි අනුගමනය කිරීමෙන්ද;

(v) කොන්ත්‍රාත්තුවට අනුව වරාය නවීකරණය කිරීම සඳහා දැරීමට සිදුවන මුදල කොපමණද;

(vi) නවීකරණ කටයුතු අවසන් කිරීමට ගත වන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

701/'16

12.

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 අයවැය යෝජනා අනුව, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව ශක්තිමත් කිරීම සඳහා ලබාදුන් මූලධන ප්‍රතිපාදන ප්‍රමාණය කොපමණද;

(ii) 2016.03.01 දිනෙන් පසු, එකී කොමිෂන් සභාව විසින් මූලධන ප්‍රතිපාදන බෙදා වෙන්කළ ආකාරය කවරේද;

(iii) රුපියල් මිලියන 123ක මූලධන ප්‍රතිපාදනවලට අමතරව, 2016 වර්ෂය වෙනුවෙන්, තවත් අතිරේක මූලධන ප්‍රතිපාදන ඉල්ලීමක් මුදල් අමාත්‍යාංශය වෙත ලැබී තිබේද;

(iv) එසේ නම්, එම අමතර ප්‍රතිපාදන ඉල්ලීමේ අරමුණු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

709/'16

13.

ගරු එස්. වියාලේන්දිරන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2015 ජනවාරි 8 වැනි දා සිට හඳුන්වා දෙන ලද දින 100 වැඩසටහන ආරම්භයේ සිට අද දක්වා අධ්‍යාපන අමාත්‍යාංශයේ සුළු සේවක පත්වීම් ලබා දී තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම පත්වීම් ලබාදීමේදී සලකා බැලූ සුදුසුකම් කවරේද;

(ii) එලෙස පත්වීම් කොපමණ සංඛ්‍යාවක් ලබා දී තිබේද;

(iii) එම පත්වීම් සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම පත්වීම් ලබා දී ඇති දෙමළ ජාතික සුළු සේවකයන් සංඛ්‍යාව කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

710/'16

14.

ගරු ප්‍රසන්න රණතුංග මහතා,— සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015.01.08 වැනි දිනට සමෘද්ධි ආධාර හිමි වූ ප්‍රතිලාභීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සමෘද්ධි ප්‍රතිලාභීන් වෙනුවෙන් ආධාර ලබාදීම සඳහා වැයකළ මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2016.04.30 වැනි දිනට සමෘද්ධි ආධාර හිමි වූ ප්‍රතිලාභීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සමෘද්ධි ප්‍රතිලාභීන් වෙනුවෙන් ආධාර ලබාදීම සඳහා රජය වැයකළ මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

711/'16

15.

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2014 වර්ෂයේ ගඟ ඉහළ ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශයේ, ගිරාඋල්ල වසමේ ගොවි නියාමක වශයෙන් කටයුතු කරන උපාලි කුමාර කිත්සිරි යන අය වංචනික ලෙස රජයේ මුදල් යොදා ගනිමින් තම පෞද්ගලික නිවසට යන මාර්ගය සකස් කර ඇති බවත්;

(ii) එම මාර්ගය ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවට අයත් නොවන බවත්;

(iii) අනවසරයෙන් හා බලහත්කාරයෙන් ගිරාඋල්ල විහාරයට අයත් කුඹුරු ඉඩම ද පුරවා සකස් කරන ලද බවත්;

(iv) ඉහත මාර්ගය සකස් කිරීම සඳහා රජයේ මුදල් ගෙවා ඇති බවත්;

(v) පුද්ගලික මාර්ගයකට රජයේ මුදල් ගෙවීම හා අනවසරයෙන් කුඹුරු ගොඩකිරීම සඳහා දේශපාලන බලය උපයෝගී කරගත් බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මේ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම පිළිබඳ දැනුම්දීම

1.

මුදල් අමාත්‍යතුමා,— එකතු කළ අගය මත බදු (සංශෝධන),— 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

බෞද්ධ විහාර දේවාලගම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*2.

ථේරවාදී භික්ෂු කතිකාවත් (ලියාපදිංචි කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

නීති කොමිෂන් සභා (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නියෝගය (අංක 1),— 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14 වැනි වගන්තිය ප්‍රකාරව සෙස් බදු සම්බන්ධයෙන් සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 ජුනි 13 දිනැති අංක 1971/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.08.26 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නියෝගය (අංක 2),— 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14 වැනි වගන්තිය ප්‍රකාරව සෙස් බදු සම්බන්ධයෙන් සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 ජුනි 13 දිනැති අංක 1971/6 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.08.26 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නියෝගය (අංක 3),— 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14 වැනි වගන්තිය ප්‍රකාරව සෙස් බදු සම්බන්ධයෙන් සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 ජුනි 28 දිනැති අංක 1973/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.08.26 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නියෝගය (අංක 4),—1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14 වැනි වගන්තිය ප්‍රකාරව සෙස් බදු සම්බන්ධයෙන් සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 ජූලි 12 දිනැති අංක 1975/40 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.08.26 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා සහ ඉඩම් අමාත්‍යතුමා,— ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ නියෝග,— (460 වැනි අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 63 වැනි වගන්තියේ (2) වැනි උප වගන්තියේ (ඊ) ඡේදය යටතේ 2013 ඉඩම් අත්කර ගැනීමේ (වන්දි ගෙවීමේ) නියෝග සංශෝධනය සම්බන්ධයෙන් ඉඩම් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 ජූලි 26 දිනැති අංක 1977/8 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.08.26 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභාව පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*12.

වෛද්‍ය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*13.

ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*14.

විසර්ජන (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*15.

විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනත යටතේ නියෝග,— 2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනතේ 36 වගන්තියේ (2) උප වගන්තියේ (ඇ) සහ (ඉ) ඡේද සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වගන්තිය යටතේ විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යවරයා විසින් සාදනු ලදුව, 2016 ජූනි මස 15 දිනැති අංක 1971/13 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.09.20 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*16.

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා,— ධීවර සහ ජලජ සම්පත් පනත යටතේ නියෝග (අංක 1),— 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 61(1) උප වගන්තියේ (ඕ) (ක) සහ (ඝ) ඡේද යටතේ, ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, අංක 1878/11 සහ 2014 සැප්තැම්බර් 01 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.09.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*17.

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා,— ධීවර සහ ජලජ සම්පත් පනත යටතේ නියෝග (අංක 2),— 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 14අ, 14ආ, 14ඇ, 14ඈ, 14ඉ, 14ඊ, 14උ, 14ඌ, 14එ, 14ඒ, 14ඔ, 14ඕ, 14ක සහ 14ග වගන්ති සමඟ කියවිය යුතු 61(1) (ත) වගන්තිය යටතේ, ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, අංක 1878/12 සහ 2014 සැප්තැම්බර් 01 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.09.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*18.

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා,— ධීවර සහ ජලජ සම්පත් පනත යටතේ නියෝග (අංක 3),— 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 14අ, 14ආ, 14ඇ, 14ඈ, 14ඉ, 14ඊ, 14උ, 14ඌ, 14එ, 14ඒ, 14ඔ, 14ඕ, 14ක සහ 14ග වගන්ති සමඟ කියවිය යුතු 61(1) (ත) වගන්තිය යටතේ, ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, අංක 1892/41 සහ 2014 දෙසැම්බර් 12 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.09.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*19.

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා,— ධීවර සහ ජලජ සම්පත් පනත යටතේ නියෝග (අංක 4),— 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 61(1)(ඌ) වගන්තිය යටතේ ස්වදේශ කටයුතු සහ ධීවර අමාත්‍යවරයා විසින් සාදන ලදුව, අංක 1904/10 සහ 2015 මාර්තු 03 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.09.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*20.

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා,— ධීවර සහ ජලජ සම්පත් පනත යටතේ නියෝග (අංක 5),— 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 61(1)(ඍඋ), (ඍඌ) සහ (ත) වගන්ති යටතේ ධීවර අමාත්‍යවරයා විසින් සාදන ලදුව, අංක 1907/47 සහ 2015 මාර්තු 26 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.09.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*21.

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා,— ධීවර සහ ජලජ සම්පත් පනත යටතේ නියෝග (අංක 6),— 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 61(1)(ඕ) සහ (ත) වගන්ති යටතේ ධීවර අමාත්‍යවරයා විසින් සාදන ලදුව, අංක 1907/47 සහ 2015 මාර්තු 26 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.09.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*22.

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා,— ධීවර සහ ජලජ සම්පත් පනත යටතේ නියෝග (අංක 7),— 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 30 වැනි වගන්තිය සමඟ කියවිය යුතු 61 වගන්තිය යටතේ ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, අංක 1924/6 සහ 2015 ජූලි 20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.09.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*23.

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා,— ධීවර සහ ජලජ සම්පත් පනත යටතේ නියෝග (අංක 8),— 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 29 වැනි වගන්තිය සමඟ කියවිය යුතු 61 වගන්තිය යටතේ ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, අංක 1938/2 සහ 2015 ඔක්තෝබර් 26 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.09.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*24.

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා,— ධීවර සහ ජලජ සම්පත් පනත යටතේ නියෝග (අංක 9),— 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 61(1)(ත) වගන්තිය යටතේ ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, අංක 1938/2 සහ 2015 ඔක්තෝබර් 26 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.09.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*25.

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා,— ධීවර සහ ජලජ සම්පත් පනත යටතේ නියෝග (අංක 10),— 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 14අ, 14ආ, 14ඇ, 14ඈ, 14ඉ, 14ඊ, 14උ, 14ඌ, 14එ, 14ඒ, 14ඔ, 14ඕ, 14ක සහ 14ග වගන්ති සමඟ කියවිය යුතු, 61(1)(ත) වගන්තිය යටතේ ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, අංක 1945/6 සහ 2015 දෙසැම්බර් 14 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.09.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*26.

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා,— ධීවර සහ ජලජ සම්පත් පනත යටතේ නියෝග (අංක 11),—1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 61(1)(ත) වගන්තිය යටතේ ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, අංක 1945/7 සහ 2015 දෙසැම්බර් 14 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.09.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*27.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2016 ජූනි 22),— "ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ආ (5)(අ) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව මැතිවරණ කොමිෂන් සභාව විසින් 2016 පෙබරවාරි 25 දිනැති අංක 1955/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.05.06 දින ඉදිරිපත් කරන ලද, ජනමතවිචාරණයකදී හෝ ඡන්ද විමසීමකට අදාළ කාලසීමාව තුළ විද්‍යුත් හා මුද්‍රිත ජනමාධ්‍ය විසින් පිළිපැදිය යුතු උපමාන හෙවත් මාර්ගෝපදේශ/ මෙහෙයුම් ප්‍රතිපත්ති අනුමත කළ යුතු ය." යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

*28.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝග,— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත, 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය සහ 14 වැනි වගන්තිය සමඟ කියවිය යුතු, එම පනතේ 20 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 පෙබරවාරි 26 දිනැති අංක 1903/41 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.09.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

29.

ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

30.

ළමා පුනරුත්ථාපන කේන්ද්‍රය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**